# <u>බස් සිංදුවල හඬ ඔබටත් පීඩාවක් ද ?</u>

කොළඹ කොටුවෙන් මොණරාගල දක්වා යන බසයට නැග ගත්තේ දිවා කාලයේ කාර්යාලයේ රාජකාරී අවසන් කොට ගතටත් සිතටත් ඇති වූ විඩාවත් සමඟිනි .සුව පහසු අසුනක් බලා අසුන් ගත්තේ නිදහසේ ගම් පියස වෙත යන්නට ඇති වූ නොනිමි ආශාවත් සමඟය. මසකට වරක් පවුලේ අය බලන්නට යන්නට එළඹෙන මේ දිනය එන තෙක් මඟ බලා සිටින්නේ කොළඹ නවාතැනටත් කාර්යාලයටත් කොටු වී ගෙවන හෙම්බත් වූ ජීවිතයට විරාමයක් තබමිනි.

බසයේ සෙනඟ ක්‍රම ක්‍රමයෙන් වැඩි වූ අතර රියදුරු මහතා අසුනට බර වී සුක්කානම අතට ගත්තේ අප සැවොම සුරක්ෂිතව ගමනාන්තය දක්වා රැගෙන යන්නටය. ඒත් සමඟම එතනට පැමිණි කොන්දොස්තර මහතා අප සැමගේම පාළුව තනිකම මකන්නට සිංදුවක් දමන්නට නම් අමතක කළේ නැත. ඇත්තටම ඔහු කළේ හොඳ දෙයක් .රැයක් එළිවෙන තුරු ගමන් කරන්නට ඇති බැවින් සිංදුවක් අහන්නට සැලැස්සූ එක නම් හොඳ දෙයක්..

දහසකුත් ප්‍රශ්න ගැටලුවලින් හෙම්බත් වෙලා ඉන්න අපිට නිදහසේ සිංදුවක් අහන්න ලැබෙන්නේ මේ වගේ වෙලාවකට විතරයි. එහි ඇති වරදක් නැත. ගැටලුව ඇත්තේ තෝරා ගන්නා ගීතයන්ගෙත් ඒවාට අනුව විකාශය වන වීඩියෝවේ සහ ක්‍රියාත්මක වන හඬේය. අදාළ ගීතය වේග රිද්ම ගීතයක් නම් රියදුරුගේ සුක්කානම කැරකෙන්නේ ද ඒ වේගයෙන්මය. පාරේ තිබෙන ගස්, වංගු , අසළ සිටින මිනිසුන් ඒ කිසිවක් පිළිබඳ සැලකිල්ලක් නම් ඔහුට නැත. එම ගීතයේ හඬ මදි යැයි රියදුරු මහතාට හෝ කොන්දොස්තර මහතාට හැඟී යන්නේ නම් තවත් වේගය වැඩි කරයි. මේ කිසිවක් සිදු කරන්නේ නම් කිසිවකුගෙන් හෝ විමසීමකින් තොරවය.

සැම දිනකම නවාතැනේ සිට රැකියා ස්ථානයට පැමිණෙන විට අසන්නට සිදුවන්නේ ද මේ ඝෝෂාකාරී හඬමය. උදෑසන නිදහස් මනසින් බසයට ගොඩ වුව ද අප බසයෙන් බැස යන්නේ මානසික වශයෙන් පීඩාකාරීත්වයකින් යුක්තවය. දිනපතාම ඇසෙන මේ හඬ අපේ කනට ද එතරම් සුදුසු නොවනු ඇත. මන්ද දිනපතාම මෙවන් ඝෝෂාවක් අසන්නට සිදුවීම මඟින් දීර්ඝ කාලයක් ගත වත්ම විවිධ රෝගාබාධයන්ට ලක් වන්නට හැකි හෙයිනි. පසු ගිය දිනෙක පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් පළ වූ ලිපියක් කියවූ මා හට එහි තිබූ විශේෂ යමක් සිහියට නැඟිනි. එනම්, පාරිභෝගිකයින් වන අපට සුදුසු පරිසරයක ජීවත් වීමේ අයිතියක් ඇති බවයි .එනම්, අනවශ්‍ය ඝෝෂාකාරී පරිසරයකින් ඈත් වී නිදහස් පරිසරයක ජීවත් වීමේ අයිතියක් ඇති බවයි. එම අයිතිය වෙනුවෙන් නැගී සිටින්නට ඔබට අයිතියක් ඇත යන්න ද එහි සඳහන්ව තිබූ බැව් මගේ සිහියට නැඟින. මේ මතකයක් සමඟින් සිටින විට දී මා අසළ අසුනේ සිටි ඔහුගේ හඬ මට ඇසිනි.



”මහත්තයා සෙට් එකේ සද්දේ නම් වැඩී වගේ නේද ඔළුවත් රිදෙනවා වගේ” “ඒකනේ......ගොඩක් දෙනෙක් නිදිත් එක්ක , අපි කියමු සද්දේ අඩු කරන්න කියලා” “කියන්න නම් පුළුවන්. ඒත් අපි කියන දේ අහයිද දන්නේ නැහැ නේද” “අපි කියමු “ යැයි මාගේ අසළ අසුනෙහි සිටි තැනැත්තාට පැවසූ මම , “මේ මල්ලී...... සෙට් එකේ සද්දේ වැඩී. ටිකක් අඩු කරමු නේද” යැයි කොන්දොස්තර මහතාගෙන් විමසූ විට දී “හා .. මහත්තයා. මම අඩු කරන්නම්. අපිට ඉතින් හුරු ඔය සද්දෙන් අහලා තමයි”. යැයි පවසමින් ඔහු ගීතයෙහි හඬ අඩු කරන ලදි.

බස් රථයක් තුළ ගමන් ගන්නා මගීන් අතර ගීත අසන්නට කැමති පිරිස් සහ අකමැති පිරිස් සිටිය හැකිය. එමෙන්ම ඔවුන් අසන ගීතයන්ගේ විවිධත්වයක් ද තිබිය හැකිය. මේ සියල්ලම දෙස බලා ගීත ප්‍රචාරය කිරීමට හැකියාවක් ද නැත. ප්‍රචාරය වන ගීතය කුමක් වුව ද එය අසන්නාට මානසික පීඩනයක් නොවන විවිධ වයස් කාණ්ඩයන් ඉදිරියේ අසා සිටිය හැකි ( ප්‍රචාරය වන වීඩියෝව පිරිසක් ඉදිරියේ නැරඹීමට හැකි ) ආකාරයේ ඒවා වීම වඩාත් වැදගත් වේ. එය බහුතර පිරිසකගේ කැමැත්ත ද වනු ඇත. වරද ඇත්තේ ඔවුන් අත නොව අප අතේමය. වරදක් දුටු විට දී එය කෙළින්ම ප්‍රකාශ කළ හැකි නම් ඔබට තව දුරටත් එම පීඩනයෙන් ජීවත් වන්නට සිදු නොවනු ඇත. නමුත් ,එය ප්‍රකාශ කිරීමේ දී ඉතා බුද්ධිමත්ව ප්‍රකාශ කළ යුත්තේ අපගේ වදන් තවත් අයෙකුගේ ජීවිතයේ අවසානය ද විය හැකි නිසාමය.

තවත් අලුත් දවසක උදාවත් සමඟින් මොණරාගලින් බසයෙන් බසින්නට ගිය මා කොන්දොස්තර මහතාටත් , රියදුරු මහතාටත් ස්තුතිවන්ත වූයේ අප සැම නිරුපද්‍රිතව ගමනේ අවසානය දක්වා රැගෙන ආ හෙයිනි.


සැකැස්ම- අවිශ්කා විරාජිනී<br>
ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී<br>
තරඟකාරීත්ව ප්‍රවර්ධන අංශය<br>
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය